## ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් සමාගම - 2017/2018

---

ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2018 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින්, පහත කරුණු දක්වමි.

(අ) විගණනයෙහි විෂය පථය හා සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට, සමාගම විසින් විධිමත් ගිණුම්කරණ පොත්පත් හා වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රජයේ ප්‍රදාන ශේෂය ලෙස රු.41,468,114 ක් දක්වා තිබූ නමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 39 හි (අ) ඡේදය ප්‍රකාරව, රජයේ ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස දැක්විය යුතු ආන්තිකය ගොඩනැගීමේ ගිණුමේ (build - up - margin account) රු. 190,933.790 ක් වූ ශේෂය වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි.

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 6(2) ඡේදය ප්‍රකාරව, ඉඩම් විකිණීමකදී ලබන ප්‍රාග්ධන ලාභය සඳහා බදු ගෙවිය යුතු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඉන් ජනිතවන ප්‍රත්‍යාගණන අතිරික්තයේ බලපෑම වාර්ෂික විලම්භිත බදු ගණනයේදී සලකා බැලිය යුතු වුවත් සමාගම සතු ඉඩම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු රු.802,208 ක් වූ මෘදුකාංග පද්ධතියේ වටිනාකම , මෙවලම් හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඇ) ඇප තැන්පතු ලෙස ගිණුම්ගත කල යුතු රු. 625,000 ක් මෙවලම් හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2.3 නීති රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වූ වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් පිළියෙල කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී ප්‍රචාරණ වියදම් වශයෙන් රු.5,044,701 ක් සභාපති/සාමාන්‍යාධිකාරී ගේ අනුමැතිය මත වැය කර තිබුණි. එම වියදමින් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් සමාගමේ නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනයට අදාල නොවූ විවිධ ආයතනවල සමරු කලාප සහ රූපවාහිනී වැඩසටහන් සඳහා දරා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. |
| (ආ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1 2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| (i) 2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 20 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන දීමනා වශයෙන් රු.3,060,000 ක් ගෙවා තිබුණි. |
| (ii) 3.3 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන අනුව, වෙන්කල වාහනයක් භාවිතා කරනු ලබන නිලධාරියෙකුට ප්‍රවාහන දීමනාව ගෙවිය නොහැකි වුවත් වෙන්කල වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකුට ප්‍රවාහන දීමනා වශයෙන් රු.460,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.68,658,203 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරිත්තය රු.39,988,886 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,669,317 ක එනම් සියයට 71 ක වර්ධනයක් විය.විකුණුම් ආදායම රු.585,509,922 කින් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013/2014 මූල්‍ය වර්ෂයේ රු.50,687,678 ක් ව පැවති සමාගමේ බදු පසු ශුද්ධ ලාභය 2014/2015 මූල්‍ය වර්ෂයේදි අඩු වී 2015/2016 මූල්‍ය වර්ෂයේ සිට නැවත ක්‍රමයෙන් වර්ධනය වී 2017/2018 මූල්‍ය වර්ෂයේදී රු.68,658,203 ක් වී තිබුණි.මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ,රජයට ගෙවූ බදු හා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013/2014 මූල්‍ය වර්ෂයේ රු.345,907,882 ක් ව පැවති සමාගමේ දායකත්වය 2014/2015 වර්ෂයේදි අඩු වී ඇති අතර ඊළඟ වර්ෂයේ සිට ක්‍රමයෙන් වැඩි වී 2017/2018 මූල්‍ය වර්ෂයේදී රු.521,452,661 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාගමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද ඊට අදාලව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

විවිධත්වයෙන් යුතු භාණ්ඩ විකුණුම්කරණය, ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඇති කීර්තිමත් වෙළඳනාමයන් අප රට තුළ නියෝජනය කිරීම, ආදායම හා ලාභය වර්ධනය කිරීම, රාජ්‍ය අංශයේ සහ පාරිභෝගික අවශ්‍යතා කාර්යක්ෂම අයුරින් ඉටු කිරීම සහ කාර්ය මණ්ඩල සංවර්ධනය තුළින් ඵලදායීතාවය වර්ධනය කිරීම සමාගමේ ප්‍රධාන අරමුණු විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සියයට 19.7 කින් වැඩි කර ගැනීමට සමත් වී තිබුණද අලෙවි අංශ 10 ක් අතුරින් රසායනික ද්‍රව්‍ය අලෙවි අංශය සහ තීරු බදු රහිත සාප්පුව යන අංශ දෙකේ සියයට 66 ක දායකත්වය මත එම වැඩිවීම සිදු වී තිබූ අතර අනෙකුත් අංශවල සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය නොවීය.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇණවුමක් වෙනුවෙන් මිලදී ගෙන තිබූ භාණ්ඩ තොගයක් එම ආයතනයට නිකුත් කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් ගබඩා කුලී ලෙස රු.367,400 ක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල කළමනාකරණය

-----------------------------------

2018 මාර්තු 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 329 දෙනෙකු හා තත්‍ය කාර්ය මණ්ඩලය 440 දෙනෙකු වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. තවද, විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් / සේවකයන් 221 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර අනුමත තනතුරු 110 ක් සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 03 ක්, සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 02ක් සහ කළමනාකරු තනතුරු 04 ක් පුරප්පාඩු වී පැවතීම තීරණ ගැනීම හා අධීක්ෂණ කටයුතු කෙරෙහි බලපා තිබූ අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කටයුතු කර නොතිබුණි.

## 4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සමාගමේ සම්පත්

------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් නවදෙනෙකු රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී එම කාර්ය මණ්ඩලය සඳහා රු.2,078,721 ක වැටුප් හා දීමනා, සමාගම විසින් ගෙවා තිබුණද එම වියදම් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 ඌන උපයෝජිත වත්කම්

----------------------------

සමාගමට අයත් රාජගිරියේ පිහිටි පර්චස් 198 ක් සහිත තක්සේරු වටිනාකම රු. 67,900,000 ක් වූ ඉඩමක් සහ තක්සේරු වටිනාකම රු.15,000,000 ක් වූ වර්ග අඩි 20,000 ක් වන ගොඩනැගිල්ලක් වසර කිහිපයකට පෙර සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ වැලිසර පිහිටි ගොඩනැගිල්ලක් සමග හුවමාරු කරගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිල්ල හුවමාරු කළ දිනය හා ඊට අදාල ගිවිසුමක් හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිල්ලක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ආ) මෙම ඉඩම සහ ගොඩනැගිල්ල සතොස සභාපතිවරයා විසින් එවකට සිටි රේඛීය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි 2011 වර්ෂයේදී ජනාධිපති ආරක්ෂක අංශයට භාර දී තිබූ අතර වර්තමානයේ දී එය පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් භාවිතා කරමින් පවතී. තවද සමූපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) විසින් 1999 අප්‍රේල් සිට 2002 නොවැම්බර් දක්වා එකතුව රු.6,720,000 ක් කුලී ලෙස සමාගමට ගෙවා තිබුණද ඉන්පසු කුලී මුදල් ගෙවා නොතිබුණි.එහෙත් සමාගම විසින් වරින් වර දේපල ආපසු භාර දෙන මෙන් ඉල්ලීම් කර තිබූ නමුත් විගණන දිනය වූ 2018 ජූලි 26 වන විටත් ආපසු භාර දී නොතිබුණි.කෙසේවුවද මෙම

ගොඩනැගිල්ල වෙනුවෙන් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාලව රු.299,250 ක් වරිපනම් ලෙස ගෙවා තිබුණි.

(ඈ) ඉහත ඉඩමෙහි පිහිටි කඩකාමර 02 ක් බාහිර පාර්ශවයක් වෙත කුලියට ලබාදීම සතොස විසින් සිදු කර තිබූ අතර ඊට අදාල කුලී මුදල් ලබා ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) මෙම ඉඩම හා ගොඩනැගිල්ල සමාගම සතුව පැවතියද සමාගමේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ග්‍රාමීය ආර්ථිකය පිළිබද අමාත්‍යාංශයට අයත් නාරාහේන්පිට ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන තිබූ අතර ඒ සඳහා 2013 ජූනි සිට 2018 මාර්තු දක්වා රු.14,582,700 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

--------------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

---------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

6. **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017/2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 13 දින ඉදිරිපත් කර තිබුණි.

**6.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර සිව් දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණද සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයන් ආවරණය කර ගැනීමට එම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් වී නොතිබුණි.

**6.3 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේ පිහිටි පරිශ්‍ර තුනක් (අංක 07, 08 සහ 10A) ප්‍රදර්ශනාගාරයක් හා ගබඩා පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ලබා ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අංක 07 දරන පරිශ්‍රය සඳහා 2017 ජනවාරි සිට විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දක්වා මාසිකව රු.207,180 බැගින් රු.4,143,600 ක් කුලී ලෙස ගෙවා තිබුණද දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි.

(ii) අංක 08 දරන පරිශ්‍රය, ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාමට උචිත වන ආකාරයට සකස් කිරීම සඳහා සමාගම විසින් රු. 272,740,141 ක මුදලක් වැය කර තිබූ අතර එම මුදල, ගොඩනැගිලි කුලියෙන් හිලව් කර ගැනීම හෝ ආපසු අය කර ගැනීම සම්බන්ධයෙන් වන කොන්දේසි කිසිවක් ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(ආ) යාපනය අලෙවිසැල පවත්වාගෙන යාම සඳහා යාපනය සී/ස විවිධ සේවා සමුපකාර සමිති ගොඩනැගිල්ලේ අංක 01 හා 02 යන පරිශ්‍ර, 2014 අප්‍රේල් 01 දින සිට 2019 මාර්තු 31 වන දක්වා වසර 05 ක් සඳහාද අංක 03 දරන පරිශ්‍රය, 2014 නොවැම්බර් 01 සිට 2017 ඔක්තෝබර් 31 දක්වා වසර 03ක් සඳහාද ලබා ගෙන තිබූ අතර මාසික කුලිය රු.40,000 බැගින් ගෙවීම සඳහා ගිවිසුම්ගතවී තිබූ අතර ඒ සම්බන්ධනේ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අංක 01 හා 02 යන පරිශ්‍ර දෙකට අදාලව ගොඩනැගිලි හිමිකරු වෙත රු.960,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද අත්තිකාරම් මුදල් පියවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර ඊට අදාල කොන්දේසිද ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(ii) අංක 03 දරන පරිශ්‍රය සඳහා රු.480,000 ක අත්තිකාරම් මුදලක් ගොඩනැගිලි හිමිකරුට ගෙවා තිබූ අතර අත්තිකාරම් මුදල පියවා ගැනීමෙන් තොරව ගිවිසුම්ගත කාලය අවසානයේ අදාල පරිශ්‍රය ආපසු භාර දීමට කටයුතු කර තිබුණි.

**6.4 නොවිසඳී ඇති විගණන ඡේද**

**-------------------------------**

සමාගමට අදාලව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත් විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් සමාගම විසින් නිවැරදි කිරීම් සිදුකර නොතිබුණු අවස්ථා පහත පරිදි වේ.

| විගණකාධිපති වාර්තාව | ඡේදයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| ----------------- | -------------- | ------------ |
| (අ) 2015/16 | 2.2.1 (ඇ) | කොන්ත්‍රාත් සමාගමක් වෙත සපයන ලද වායුසමීකරණ යන්ත්‍ර වෙනුවෙන් අයවිය යුතු රු.1,756,220 ක් අයකර නොගැනීම. |
| (ආ) 2015/16 | 4.3 (ආ) | ගොවීන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව මිලදී ගන්නා ලද රු.75,171,712 ක් වටිනා ජංගම ගබඩා(කොකූන්) 35 ක් අලෙවි කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) 2016/17 | 2.2 (අ) (1) | නිල වාහන භාවිතා කිරීමේ හිමිකම නොමැති නිලධාරීන් 21 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනා වශයෙන් රු.3,180,000 ක් ගෙවීම. |
| (ඇ) 2016/17 | 2.2 (අ) (11) | නිල වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකුට ප්‍රවාහන දීමනා වශයෙන් රු.480,000 ක් ගෙවීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2016/17 | 2.2 (අ) (111) | අනුමැතියකින් තොරව නිලධාරීන් දෙදෙනෙකුට මාසික ඉන්ධන සීමාව ඉක්මවා රු. 728,588 ක ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම. |
| (ඊ) | 2016/17 | 4.2 | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් දහ දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර රු.2,157,700 ක වැටුප් හා දීමනා සමාගම විසින් ගෙවීම. |

**7. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදි නිරික්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාටි හා ක්‍රමවේදයන්ට වඩා පෙර භාවිතයන් මත ගිණුම් පිළියෙල කිරීම.<br>(ii) පවත්නා කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන නොවීම.<br>(iii) ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම.<br>(iv) කෙටිකාලීන හා දිගුකාලීන ලෙස ණය ශේෂ වර්ගීකරණය නොකිරීම. |
| (ආ) අභ්‍යන්තර පාලනය | විධිමත් ලේඛනගත අභ්‍යන්තර පාලන පරිපාටියක් නොමැති වීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | ඇතැම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම |
| (ඈ) තොග පාලනය | තොග පාලනය හා තොග වාර්තා පවත්වා ගැනීමේ දුර්වලතා පැවතීම. |
| (ඉ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ | දීර්ඝකාලීනව හිඟහිටි වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ අය කර නොගැනීම. |
| (ඊ) මූල්‍ය කළමනාකරණය | මුදල් අතිරික්තය ස්ථාවර වත්කම්වල යෙදවීම සහ මූල්‍ය අවශ්‍යතා සඳහා කෙටිකාලීන ණය ලබාගෙන පොලී ගෙවීම් කිරීම. |